# 02 කොටස් වෙළෙඳපොළ ආයෝජනය

ඕනෑම ආයෝජනයක් සිදු කිරීමට පෙර ආයෝජකයකු සිතා බැලිය යුතු කරුණු කිහිපයක් පෙර පරිච්ඡේදයේදී පළ කළ අතර ආයෝජන මාර්ග අතරින් ඔබ කොටස් වෙළෙඳපොළ ආයෝජනය තෝරා ගත්තේ නම් මෙම සතියේ සිට පළ කරන ලිපි පෙළ මගින් කොටස් වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීමට හැකි වනු ඇත.

කොටස් වෙළෙඳපොළ තුළ ආයෝජනය කරන්නේ කෙසේද යන්න සාකච්ඡා කිරීමට ප්‍රථමව ඔබ ශ්‍රී ලංකාව තුළ කොටස් වෙළෙඳාමට සම්බන්ධව ඇති ආයතන පිළිබඳ දළ අවබෝධයක් ලබා ගතහොත් එය ඔබට පිටිවහළක් වනු ඇත. මන්ද යත් මෙයින් සමහර ආයතන විසින් ගනු ලබන තීරණ සහ ඔවුන්ගේ ක්‍රියාපටිපාටිය කොටස් වෙළෙඳපොළේ පැවැත්මට සහ එහි කාර්යසාධනයට සෘජුවම බලපාන බැවිනි.

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළට සෘජුවම සම්බන්ධ ආයතන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් වෙළෙඳපොළ, කොටස් තැරැව්කාර ආයතන, ඒකකභාර කළමනාකරණ ආයතන සහ ලයිස්තුගත සමාගම් ප්‍රධාන තැනක් ගනී.

ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු ක්ෂේත්‍රය නියාමනය කරන ආකාරයට සමානවම ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කරන ආයතනය වනුයේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවයි.

### ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ නියාමනය සහ ආයෝජක රැකවරණය

ශ්‍රී ලංකාව තුළ විධිමත් සහ සාධාරණ සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇති කිරීම සහ පවත්වාගෙන යාම යන අරමුණ මූලික කරගෙන ආරම්භ කර ඇති ආයතනය වන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවයි. පසු ගිය වසර කිහිපය තුළ සිදු වූ සීඝ්‍ර වර්ධනයත් සමගම ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය සඳහා ජනතාව තුළ ඇති වූ වඩා වැඩි උනන්දුව නිසාම ප්‍රාග්ධන වෙළෙඳපොළ විනිවිද භාවයකින් සහ සාධාරණ ලෙස පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය කටයුත්තකි. වර්තමානය වන විට මෙම ප්‍රාග්ධන වෙළඳපොළ තුළ විවිධ වූ සේවාවන් සපයන ආයතන පද්ධතියක් ද බිහි වී ඇත. එමෙන්ම වර්තමානයේ දේශීය සහ විදේශීය ආයෝජකයින්ගේ ද

ආකර්ෂණය ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත යොමු වී ඇත. එබැවින් මේ සම්බන්ධව විධිමත් සහ සාධාරණ නියාමනයක් තිබීම ද අත්‍යවශ්‍යයෙන්ම ඉටු විය යුතු කරුණකි. මේ කටයුත්ත සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවා ඇත.

1987 අංක 36 දරන පාර්ලිමේන්තු පනත යටතේ පිහිටවනු ලැබූ මෙම ආයතනය මුදල් අමාත්‍යංශය යටතේ පවත්වාගෙන යනු ලැබේ. එදා මෙදා තුර ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ සංවර්ධනාත්මක කාර්යයන් රාශියක් සිදු කර ඇති ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මහජනයා අතර වඩාත් කතා බහට ලක් වූයේ පසුගිය වසර කිහිපය තුළදීය.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සුරැකුම්පත් වෙළෙඳපොළ සම්බන්ධ නීතිරීති හා විධිවිධාන පැනවීමත් ඒවා ක්‍රියාත්මක කිරීමත් සහ ඒවා කඩ කරන්නන් සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමත් කරයි.

## ශ්‍රී ලංකා සුරැකුම් පත් සහ විනිමය කොමිෂන් සභාවේ සංයුතිය

කොටස් වෙළෙඳපොළ, ඒකක භාර ඇතුළු ප්‍රාග්ධන වෙළෙඳපොළට සම්බන්ධව විවිධ වූ වැදගත් තීන්දු තීරණ ගනු ලබන්නේ කොමිෂන් සභාවේ පොදු එකඟතාවයක් තුළිනි. ස්වාධීන ආයතනයක් වශයෙන් කටයුතු කිරීමේ බලය මෙම කොමිෂන් සභාව සතු වන අතර එය සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත වේ. එනම්

### පත්කළ සාමාජිකයින්

- මහබැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලබන මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයෙකු සහ
- නෛතික, මූල්‍ය, ව්‍යාපාරික හා පරිපාලන කරුණු විෂයෙහි පුළුල් පළපුරුද්දක් සහ සමාර්ථ්‍යය දක්වා ඇත්තා වූ තැනැත්තන් යයි අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් හය දෙනෙක්

### නිල බලයෙන් පත්වන සමාජිකයින්

- මහාභාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්
- සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සහ
- වරලත් ගණාධිකාර ආයතනයේ සභාපතිවරයා

මෙම සාමාජිකයන් දස දෙනා අතරින් එක් පුද්ගලයෙකු සභාපතිවරයෙකු ලෙස තෝරා පත් කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ විවිධ වූ සේවාවන් සපයමින් රටේ ආර්ථිකයට සෘජු දායකත්වයක් දක්වන ආයතන රාශියක් වර්තමානය වන විට බිහිවී ඇත. මෙම සියළුම ආයතන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමනයට ලක්වෙයි. මෙම නියාමනයට ලක්වන ආයතන පහත සඳහන් පරිදි ඔබගේ දැනගැනීම පිණිස පෙළ ගැස්විය හැක.

- කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව (Colombo Stock Exchange)
- කොටස් තැරැව්කාර සමාගම් (Stock Broking Companies)
- ඒකකභාර කළමනාකරණ සමාගම් (Unit Trust Management Companies)
- ණය ප්‍රමාණීකරණ නියෝජිතායතන (Credit Rating Agencies)
- ආයෝජන කළමනාකරුවන් (Investment Managers)
- ආන්තික ගිණුම් සැපයුම්කරුවන් (Margin Providers)
- ප්‍රාරක්ෂකයින් (Underwriters)
- සුරැකුම්පත් තැන්පතු/නිශ්කාෂණ ආයතන (Depositories/ Clearing Houses)

මෙම ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම, නීතිරීති හඳුන්වාදීම, බලපත්‍ර අළුත් කිරීම, හෝ අවලංගු කිරීමේ බලය යනාදී බලතල ඇතුළු තවත් බලතල රාශියක් පාර්ලිමේන්තු පනත මගින් කොමිසම වෙත ලබා දී ඇත.

**කොමිෂන් සභාවේ අරමුණු**

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඇති කරන ලද්දේ පහත සඳහන් අරමුණු හතර උදෙසා ය.

**1. විධිමත් සහ සාධාරණ ආකාරයකට සුරැකුම්පත් නිකුත් කිරීම සහ වෙළෙඳාම් කිරීම කළ හැකි වෙළෙඳපොළක් බිහි කිරීම සහ පවත්වාගෙන යාම**

මෙම අරමුණ ඉටුකර ගැනිම සඳහා කොමිෂන් සභාව කාර්යයන් රාශියක නිරත වේ. පළමුව එමගින් ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළට යෝග්‍ය වන්නා වූ නීතිරීති සමුදායක් ක්‍රියාත්මක කරනු ලැබේ.

**2. ආයෝජකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම**

මෙය අතිශයින් වැදගත් වගකීමක් වේ. සාමාන්‍ය මහජනතාවට කොටස් වෙළෙඳපොළ හඳුන්වාදීමත් සමඟ සුළු ආයෝජකයන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව ඉතා වැදගත් කරුණක් බවට පත්විය. ප්‍රධාන කරුණු දෙකක් නිසා ආයෝජකයන්ට ආරක්ෂාව අවශ්‍ය වේ.

a. අධිකරණ මාර්ගයෙන් සහන ලබා ගැනීම පිණිස කාලයත්, විශාල මුදලකුත් වැයවීම

b. දැනුම අඩු ආයෝජකයන් වෙළෙඳපොළට පිවිසීම

කොටස් වෙළෙඳපොළ තැරැව්කරුවෙකු හෝ වෙළෙන්දෙකු හෝ ආයෝජන භාර කළමනාකරණ සමාගමක් විසින් කරන ලද යම් නීතිය කඩ කිරීමක් හෝ අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කොමිෂන් සභාව විසින් භාර ගනු ලැබේ. එවැනි පැමිණිල්ලක් ලැබුණු විට කොමිෂන් සභාව එය පරීක්ෂා කර අවශ්‍ය නම් විමර්ශනයක් පවත්වයි. විමර්ශනයේ සංකීර්ණත්වය අනුව විමර්ශනය පැවැත්වීමේ කාර්යය කොමිෂන් සභාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙනු ලැබිය හැක. විමර්ශනයේ ප්‍රතිඵල අනුව කොමිෂන් සභාවට පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගත හැකිය.

- තත්ත්වයට පිළියම් යෙදීම සඳහා අදාළ සංවිධානයන්ට විධිවිධානයන් නිකුත් කිරීම සහ අදාළ තැනැත්තන්ට විරුද්ධව ගතයුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.
- වරද සමථයකට පත් කිරීම.
- කොටස් වෙළෙඳපොළෙහි, තැරැව්කරුවන්ගේ හෝ ඒකක භාර කළමනාකරණ සමාගම්වල බලපත්‍ර තාවකාලිකව හෝ ස්ථිරව අවලංගු කිරීම.
- කාරණය උපදෙස් සඳහා හෝ චෝදනා සකස් කොට අධිකරණයක නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කිරීම හෝ සෘජුවම කොමිෂන් සභාව මෙම කටයුතු කිරීම.

## 3. තැරැව්කරුවෙකු තම ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට අසමත් වීම නිසා ඇති වන මුදල් අලාභ සම්බන්ධයෙන් ආයෝජකයන් ආරක්ෂා කිරීම පිණිස වූ වන්දි අරමුදලක් (Compensation Fund) ක්‍රියාත්මක කිරීම

කොටස් තැරැව්කරුවෙකු හෝ වෙළෙන්දෙකු වස්තු භංගත්වයට පත් වූ බව ප්‍රකාශ කළ හොත් ආයෝජකයන්ට සහනය සැලසීම පිණිස වන්දි අරමුදලක් කොමිෂන් සභාව විසින් පිහිටුවා ඇත. තැරැව්කරුවෙකුගේ හෝ වෙළෙන්දෙකුගේ වස්තු භංගත්වය නිසා මුදලින් අලාභයක් විඳින ආයෝජකයකුට ඒ අලාභය සිදු වී තෙමසක් ඇතුළත වන්දි අරමුදලින් වන්දි

හිමිකම්පෑමක් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ හැකිය.

## 4. සුරැකුම්පත් වෙළෙඳපොළ විධිමත් කිරීම සහ එහි වෘත්තීය ප්‍රමිති පවත්වාගෙන යන බව සහතික කිරීම.

කොටස් වෙළෙඳපොළ, කොටස් තැරැව්කරුවන්, ඒකක භාර සහ ලැයිස්තුගත සමාගම් විසින් වෘත්තීය ප්‍රමිති පවත්වාගෙන යන බවට වගබලා ගැනීම කොමිෂන් සභාවේ අරමුණකි. කොමිෂන් සභාව විසින් ද කොළඹ කොටස් හුවමාරුව විසින්ද විවිධ පුහුණු පාඨමාලා මගින් කොටස් තැරැව්කාර ආයතනවල නිළධාරීන්ට අවශ්‍ය වෘත්තීය දැනුම ලබාදීම කරයි.

## කොමිෂන් සභාවේ බලතල, වගකීම් සහ කාර්යයන්

කොමිෂන් සභාවේ අරමුණු ඉටුකර කිරීම සඳහා එයට පහත දැක්වෙන බලතල පාවිච්චි කිරීමටත්, වගකීම් ඉටු කිරීමටත් සහ කාර්යයන්වල නියැලීමටත් හැකියාව තිබේ.

- කොටස් හුවමාරුවක් ලෙස ක්‍රියාත්මක වීම සඳහා ආයතනයකට බලපත්‍ර ලබාදීම සහ එම ආයතනය නිසි පරිදි පවත්වාගෙන යන බවට වගබලා ගැනීම. වර්තමානයේ දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවට (කොළඹ කොටස් වෙළෙඳපොළ) ශ්‍රී ලංකාව තුළ කොටස් වෙළෙඳපොළක් ලෙස ක්‍රියාත්මක වීමට බලපත්‍රයක් ලබා දී ඇත.
- කොටස් තැරැව්කරුවන්ට, කොටස් වෙළෙන්දන්ට සහ ඒකක භාර කළමනාකරණ සමාගම් වලට බලපත්‍ර ලබාදීම සහ එම ආයතන හෝ පුද්ගලයන් එම ව්‍යාපාර නිසි පරිදි පවත්වාගෙන යන බවට වගබලා ගැනීම.
- බලපත්‍රලත් කොටස් හුවමාරුවකට, කොටස් තැරැව්කරුවෙකුට, හෝ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියෙකුට කලින් කලට පොදු හෝ විශේෂිත නියෝග නිකුත් කිරීම.
- කොටස් තැරැව්කරුවෙකු හෝ වෙළෙන්දෙකු තම ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට අසමත් වීම හේතු කොටගෙන මූල්‍යමය අලාභ විඳින ආයෝජකයන්ට වන්දි ලබා දීම.
- සුරැකුම්පත් වෙළෙඳපොළ සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම
- ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා යම් නිශ්චිත සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම හෝ වෙළෙඳාම් කිරීම අවලංගු කිරීම හෝ අත්හිටුවීම හෝ සියළුම ලයිස්තුගත සුරැකුම්පත්වල වෙළෙඳාම්

කිරීම වසරකට තෙදිනකට නොවැඩි කාලයකට අත්හිටුවීම

- කොටස් වෙළෙඳපොළෙහි, කොටස් තැරැව්කරුවන්ගේ, කොටස් වෙළෙන්දන්ගේ, ඒකක භාර කළමනාකරණ සමාගම්වල, ඒකක භාරවල භාරකරුවන්ගේ, වෙළෙඳපොළ අතරමැදියන්ගේ හෝ ලැයිස්තුගත පොදු සමාගම්වල ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම
- සුරැකුම්පත් වෙළෙඳපොළ සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- කොමිෂන් සභා පනතේ විධිවිධාන හෝ පනත යටතේ පනවා ඇති රීති සහ රෙගුලාසිවල කඩ කිරීම් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම
- උක්ත බලතලවලට අමතරව කොටස් තැරැව්කරුවන්ගේ, කොටස් වෙළෙන්දන්ගේ, වෙළෙඳපොළ අතරමැදියන්ගේ සහ ඒකක භාර කළමනාකරණ සමාගම්වල බලතල අවලංගු කිරීමේ බලතල ද කොමිෂන් සභාවට ඇත.

විධිමත් සහ සාධාරණ වෙළෙඳපොළක් පවත්වාගෙන යාමේ අරමුණින් ප්‍රාග්ධන වෙළෙඳපොළට බලපාන නීතිරීති පැනවීමට අමතරව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් රටේ ප්‍රාග්ධන වෙළෙඳපොළ වර්ධනය සඳහාද තම දායකත්වය සපයයි.

පසුගිය සතියේ ලිපියෙහි සඳහන් කළ ආකාරයට තවමත් කොටස් වෙළෙඳපොළේ ආයෝජනය පිළිබඳව මහජනයා එතරම් දැනුවත් බවකින් යුක්ත නොවන අතර කොටස් වෙළෙඳපොළ සහ ඒකක භාර පිළිබඳව මහජනයා දැනුවත් කිරීම සඳහාද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඉදිරිපත් වී සිටියි.

විශේෂයෙන්ම ඉතිරිකිරීමක දී මෙන් නොව කොටස් වෙළෙඳපොළ සහ ඒකක භාර තුළ ආයෝජනයේ දී ආයෝජකයා ඒ පිළිබඳව යම් හැදෑරීමක් කළ යුතුය. එසේ හැදෑරීමක් කිරීම සඳහා ඕනෑම ආයෝජකයකු හට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් පවත්වන ආයෝජක පාඨමාලා, දේශන, සම්මන්ත්‍රණ, ආයෝජක දින ආදියට සහභාගී විය හැකිය.

එමෙන්ම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් මහජනයා දැනුවත් කිරීම සඳහා විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය මගින් නොකඩවා විවිධ ලිපි, සාකච්ඡා කොටස් වෙළෙඳපොළ හා ඒකක භාර පිළිබඳව පළ කරනු/පවත්වනු ලබයි.

එමෙන්ම විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, උපාධි අපේක්ෂකයින්, පාසැල් ගුරුවරුන් සහ සිසුන් දැනුවත් කිරීම සඳහාද වෙනම දේශනා පාඨමාලා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හරහා සංවිධානය වේ.

කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන ඔබට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිළිබඳ දළ අවබෝධයක් ලබාදීමට අපි උත්සාහ කළෙමු. ආයෝජනය කිරීමට ප්‍රථමව තමන් කිරීමට බලාපොරොත්තු වන ආයෝජනයෙහි නීතිමය තත්ත්වය තමන්ට ඇති ආරක්ෂාව ඔබ හට පැහැදිළි කිරීම මෙහි අරමුණ විය.

අවසන් වශයෙන් ඉතා වැදගත් කරුණක් කෙරෙහි ඔබගේ අවධානය යොමු කළ යුතුවේ. එනම් ඔබ කොටස් වෙළෙඳපොළේ හෝ ඒකක භාරයක ආයෝජනය කරන විට ඔබගේ කොටස් තැරැව්කාර ආයතනය (දැනට බලපත්‍රලාභී කොටස් තැරැව්කාර ආයතන 29 ක් පවතී) ඒකක භාර කළමනාකරණ සමාගම (දැනට බලපත්‍රලාභී ඒකක භාර කළමනාකරණ සමාගම් 11 ක් පවතී) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් බලපත්‍රලාභී ආයතන දැයි තහවුරු කර ගත යුතු වේ. එමෙන්ම ඔබගේ ආයෝජන උපදේශක සහතිකලත් ආයෝජන උපදේශකයෙකුද එසේත් නැත්නම් නියමිත සුදුසුකම් සපුරා ඇති ආයෝජන උපදේශකයෙකු ද යන්න පිළිබඳව හොඳින් දැනුවත්වී තම ආයෝජන කටයුතු සිදු කිරීම වඩාත් උචිත වේ. මේ පිළිබඳව ඉදිරියේදී සාකච්ඡා කෙරේ.